# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


අංක 1826/40 – 2013 සැප්තැම්බර් 06 වැනි සිකුරාදා – 2013.09.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

33 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: ඩීඑස්බී/එල්එන්ඩී/03/ඒකිවියූඅයිසී/30.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: එල්ඩී/05/2005/එච්ඩබ්ලිව්/15.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම්, ජයමහ හිටිහාමිලාගේ සුගත් පුෂ්පක ජයමහ වන මා විසින් ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 33 වැනි වගන්තිය යටතේ පහත සඳහන් උපලේඛනයේ විස්තර කරන ඉඩම අත්කර ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු වන්දි මුදල වන (රුපියල් 22822.22) රුපියල් විසිදෙදාස් අටසිය විසි දෙකකුත් සත විසි දෙකක මුදල අයිතිකරුට ලබා ගැනීම පිණිස තංගල්ල දිසා අධිකරණයේ නඩු අංක 100/12 යටතේ තංගල්ල ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ගිණුම් අංක 10713-01-21703ට 2012.05.22 දින බැර කර ඇති බවත් එම මුදලට අදාළ පොලී මුදලින් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත යැවිය යුතු 10% ක බදු මුදල් අඩුකර ඉතිරි මුදල වන (රු. 4426.15) රුපියල් හාරදහස් හාරසිය විසි හයකුත් ශත පහළොවක මුදල එම ගිණුමට 2012.10.10 දින බැර කර ඇති බව කාරුණිකව දන්නා සිටිමි.

උපලේඛනය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නාකුළුගමුව උතුර ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක අ.ග.පි. 302 - 23/27 එච්/බීඑල්ජ්/ 2007/52 හා 2008.08.08 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 549 හා 550 වශයෙන් දැක්වෙන පර්චස් 10.27 ක් (හෙක්. 0.0026) ක් වූ තොලබෙට්ටිආර නමැති ඉඩමෙන් නොබෙදූ 1/18 (පර්චස් 0.57) ක හිමිකම වෙනුවෙන්

ජේ. එච්. එස්. පී. ජයමහ,
ප්‍රාදේශීය ලේකම්,
බෙලිඅත්ත.

2013 සැප්තැම්බර් මස 03 වැනි දින.
බෙලිඅත්ත, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය

09 - 931